# සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස-්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත

## ලියා දන්වන වග

### මිථ්‍යාවට යටවෙමින් සිටින ජාතියක්



කුරුණෑගල මහනුවර මාර්ගයේ පිලැස්ස වංගුව අසළ බහුලව අනතුරු සිදුවන්නේ යයි කියා අනතුරු අඩු කරගැනීමට ඒ වංගුව අසළට මහා සංඝ රත්නය වැඩම කර පිරිත් සජ්ජායනයක් පැවැත්වීමට මාවතගම පොලීසිය කටයුතු කිරීම ශ්‍රී ලංකාව මිථ්‍යාවේ ගිලෙමින් තිබීමේ බෙදවාචකය මැනැවින් පෙන්වා දෙන සිදුවීමකි. පොලිසියේ හෝ වෙනත් ආයතනයක අඩුපාඩුකම් වසා ගැනීමට ධර්මයට මුවා වීම හාස්‍යයට වඩා කෝපයක් ඇති කරවන කාරණයකි.

පිරිත් බලයෙන් අනතුරු අඩුකර ගත හැකි නම් ඒ මහා සොයා ගැනීම ලොවටම බෙදා හැර දිනකට අනතුරු වලින් මිය යන දස දහස් ගණනක් වන මිනිසුන් මරණයෙන් බේරා ගන්නට උත්සාහ නොක-රන්නේ මන්දැයි ශ්‍රී ලංකා පොලිසියෙන් ඇසිය යුතුය.

පොලිසිය කළ යුත්තේ නීති ගරුක ලෙස රිය පැදවීම පිළිබඳව රියදුරන් දැනුම්වත් කිරීමය. එය නොකර රට හිනස්සන මෙවන් ක්‍රියාමාර්ග වලින් සිදුවන්නේ පොලිසියත් හෑල්ලු වී ධර්මයත් හෑල්ලු වීමය. මේ බව පොලිසියේ අඥාන නිලධාරීන්ට කියා දෙන්නට සමත් බොදු යතිවරයෙකු නොසිටීම ජාතියේම අවාසනාවකි.

## යුද්ධය නිමාවී සත් වසකට පසු...

# කුමාර්ගේ සහ කුමාරලාගේ සිහින



ශ්‍රීලාල් සෙනෙවිරත්න



යාපනය නගරය ගිනියම් වෙමින් තිබේ. ඒ ගිනි අව්වලින් වීසිවන උණ්ඩ වරුසාවන්ගෙන් නොවේ. ක්ෂිතිජයෙන් මතුවී ඉසිඹු නොලබා මුදුන් වෙමින් තිබෙන හිරුගේ චණ්ඩ රශ්මියෙනි. දශක තුනක් පුරාවට වරින් වර යුද ගින්නෙන් දැවෙමින් තිබුණු මේ භූමියේ වෙඩි හඬ සපුරා නතරවී මේ වන විට ඉක්ම ගොස් ඇති කාලය වසර හතකි.

යාපනය නගරයේ දැන් යුද්ධයේ නටඹුන් හෝ දකින්නට නොමැත. එය මුළුමනින්ම පාහේ අගනුවර හෝ මහනුවර හෝ දකුණේ වෙනත් ප්‍රධාන නගරයක් හා සමව දිස්වන, ක්‍රියාත්මක වන තවත් කාර්ය බහුල නගරයකි. යාපනය බස් නැවතුම්පොල පසුකොට රෝහල පාරේ මද දුරක් ඉදිරියට පැමිණි විට දකුණු පසින් හමුවන්නේ සති පොළක් බඳු කඩපොළකි. එහි කඩ පිල්වල අලෙවියට තබා ඇති යාපනයට ආවේනික විවිධ නිෂ්පාදන අතරින් වැඩි වශයෙන් නෙත් පැහැරගන්නේ තල් හකුරුය.

මට ඔහු හමුවන්නේ ඒ කඩ පිළකදීය. කහ පැහැති ටී ෂර්ටයකින් සහ දිග කලිසමකින් සැරසී අනලස්ව වෙළඳාම් කටයුතුවල නිරතව සිටින ඔහුගේ කටයුතුවලට බාධා නොවන ආකාරයෙන් මම ඔහු හා කතාබහකට මුල පිරුවෙමි.

8 වන පිටට